මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක : PE/2024/49** **2024.10.31**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(1) (ආ) හා (ඇ) වැනි වගන්තිය අනුව පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම් සහ එක් එක් ස්වාධීන කණ්ඩායම හැඳින්වීමේ අංකය, ඒ එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කරන ලද ලකුණු, ඡන්ද පත්‍රිකාවෙහි දැක්වෙන අනුපිළිවෙළ, අපේක්ෂකයින්ගේ නම්, ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කරන ලද මනාප අංක සහ ඡන්ද පොළවල පිහිටීම සඳහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2405/50 හා 2024 ඔක්තෝම්බර් මස 11 වැනි සිකුරාදා දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රය සහ ;

පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කිරීමට අපේක්ෂිත ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වශයෙන් තෝරා පත්කර ගැනීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ සුදුසුකම් ඇති තැනැත්තන්ගේ ලැයිස්තු සඳහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2405/51 හා 2024 ඔක්තෝම්බර් මස 11 වැනි සිකුරාදා දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රය මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්